SLAB
SRI LANKA ACCREDITATION BOARD

# ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

## වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

# පුරප්පාඩු

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සඳහා වන පහත දක්වා ඇති තනතුරු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනු පරීක්ෂණ/ක්‍රමාංකන විද්‍යාගාර, වෛද්‍ය රසායනාගාර, පරීක්ෂණ ආයතන සහ අනුකූලතා තක්සේරු කිරීම්වලට සම්බන්ධ වලංගු කිරීමේ ආයතන ප්‍රතීතනය කිරීම සඳහා වගකියනු ලබන, 2005 අංක 32 දරණ පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකාව සඳහා වන ජාතික ප්‍රතීතන අධිකාරියයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වර්තමානයේදී වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ප්‍රතීතන වැඩසටහන් සඳහා **IAF MLA** සහ **ILAC MRA** විසින් පිළිගැනීමට ලක්ව ඇත.

**අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්:**

- අයදුම්පත් අප විසින් නම් කරන ලද ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු බවත් එය අපගේ **www.slab.lk** නිල වෙබ් අඩවියෙන් බාගත හැකි බවත් කරුණාවෙන් සලකන්න.
- මූලික සුදුසුකම් පමණක් සනාථ කරන ලියකියවිලි වල සහතික කළ පිටපත් ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.
  සභාපති,
  ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය,
  අංක 44. විශේෂ ආර්ථික මධ්‍යස්ථානය,
  නාරාහේන්පිට,
  කොළඹ 05.
- ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
- රජය විසින් අනුමත දීමනාවන් ගෙවනු ලැබේ. අනෙක් ප්‍රතිලාභවලට පහත දේ ඇතුළත් වේ.
  - සේ.අ.අ. දායකත්වය: සේව්‍යයා විසින් 15%
  - සේ.නි.භා.අ. දායකත්වය: සේව්‍යයා විසින් 3%
  - අග්‍රහාර වෛද්‍ය රක්ෂණාවරණ හිමිකම්
- කිසිදු ප්‍රවාහන දීමනාවක් ප්‍රතිපූර්ණය නොකරන බව කරුණාවෙන් සලකන්න.
- අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනය: **2025 සැප්තැම්බර් 15**

## අධ්‍යක්ෂක - තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර :**

**වෘත්තීය :**

1. විද්‍යා විෂයයන්ගෙන් විද්‍යාවේදී මූලික උපාධියක් සහ අදාළ පශ්චාත් උපාධි සුදුසුකම (විද්‍යාපති)

හෝ

2. රසායනාගාර වෛද්‍ය විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාවට අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සහ අදාළ පශ්චාත් උපාධි සුදුසුකමක් (විද්‍යාපති)

හෝ

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී ඉංජිනේරු (B.Sc (Eng.) ) මූලික උපාධිය හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් සහ අදාළ පශ්චාත් උපාධි සුදුසුකම් (විද්‍යාපති)

**පළපුරුද්ද :**

සුදුසුකම් ලැබීමෙන් පසු කළමනාකරණ මට්ටමක වසර විස්සක (20) පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවම වශයෙන් වසර පහක් (5) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් විය යුතු අතර ප්‍රතීතනය, අනුකූලතා තක්සේරුව, පද්ධති විගණනය සහ අදාළ ක්‍රියාකාරකම් පිළිබඳ වසර දහයක (10) පළපුරුද්දක් තිබිය යුතුය.

සහ

අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි සහ අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ මනා දැනුමක් සහ විවිධ කණ්ඩායම් මෙහෙයවීමට සනාථ කළ හැකියාවක් තිබිය යුතු අතර මානව සහ අනෙකුත් සම්පත් කළමනාකරණය සහ යෙදවීම පිළිබඳ පළපුරුද්ද සහිත, සුදුසුකම් ලත් තත්ත්ව පද්ධති ප්‍රමුඛ තක්සේරුකරුවෙකු විය යුතුය.

**අභ්‍යන්තර :**

**පළපුරුද්ද :**

SLAB හි අතිරේක අධ්‍යක්ෂක තනතුරේ අවම වශයෙන් අවුරුදු පහක (5) සේවා කාලයක්.

සහ

අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි සහ අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ මනා දැනුමක් සහ විවිධ කණ්ඩායම් මෙහෙයවීමට හැකියාවක් තිබිය යුතු අතර මානව සහ අනෙකුත් සම්පත් කළමනාකරණය සහ යෙදවීම පිළිබඳ පළපුරුද්ද සහිත විය යුතුය.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය :** HM - 2-3 - 2025 - රු. 173,000 - 4850 x 12 = 231,200

කෙසේ වෙතත්, 2027.01.01 දින දක්වා සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා වන වේතන MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුකූල විය යුතුය.

**වයස :**

වයස අවුරුදු 40 ට නොඅඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ස්ථිර කිරීම :**

මෙම කාණ්ඩයට පත්වීම් ලබන බාහිර අපේක්ෂකයකු, රාජකාරි භාරගැනීමේ සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. මෙම කාල සීමාව අවසානයේදී ඔහුගේ/ඇයගේ කාර්ය සාධනය සහ හැසිරීම සතුටුදායක බව තහවුරු කළහොත් ඔහු/ඇය ස්ථිර කරනු ලැබේ. අභ්‍යන්තර අපේක්ෂකයින් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

**බඳවාගැනීමේ පටිපාටිය :**

බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ ප්‍රසිද්ධ දැන්වීමක් හෝ පුවත්පත් දැන්වීමක් හරහා අයදුම්පත් කැඳවීමෙන් පසුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකිනි.

සම්මුඛ පරීක්ෂණයේදී කුසලතා අනුපිළිවෙලට පමණක් පත්වීම් සිදු කරනු ලැබේ.

## පරිපාලන නිලධාරී - තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර :**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍ය පිළිබඳ උපාධිය.

**අභ්‍යන්තර :**

1. ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළින් කළමනාකරණ සහායක/- තාක්ෂණික නොවන (MA1-2) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (5) සම්පූර්ණ කර තිබීම.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය :** JM 1-1 - 2025 - රු. 72,650 - 1360 x 10 - 2040 x 18 = 122,970

කෙසේ වෙතත්, 2027.01.01 දින දක්වා සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා වන වේතන MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුකූල විය යුතුය.

**වයස :**

වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ස්ථිර කිරීම :**

මෙම කාණ්ඩයේ II ශ්‍රේණියට පත්වීම් ලබන බාහිර අපේක්ෂකයකු, රාජකාරි භාරගැනීමේ සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ/ඇයගේ කාර්ය සාධනය සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය සමත් වීමෙන් පසුව, පරිවාස කාලය අවසානයේදී ඔහු/ඇය තනතුරේ ස්ථිර කෙරෙනු ලැබේ. දැනටමත් තනතුරේ ස්ථිර කර ඇති අභ්‍යන්තර සේවකයන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත් වෙනු ඇත.

**බඳවාගැනීමේ පටිපාටිය :**

ලිඛිත විභාගයක් සහ/හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය තුළින්

## තාක්ෂණික නිලධාරී (තොරතුරු තාක්ෂණ) - තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර :**

(පහත 1 හෝ 2 හෝ 3)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික උපාධිය ලබා තිබීම.
2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම.

සහ

සුදුසුකම ලැබීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද

3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම.

සහ

සුදුසුකම ලැබීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර :**

ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය :** JM 1-1 - 2025 - රු. 72,650 - 1360 x 10 - 2040 x 18 = 122,970

කෙසේ වෙතත්, 2027.01.01 දින දක්වා සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා වන වේතන MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුකූල විය යුතුය.

**වයස :**

වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ස්ථිර කිරීම :**

මෙම කාණ්ඩයේ II ශ්‍රේණියට පත්වීම් ලබන බාහිර අපේක්ෂකයකු, රාජකාරි භාරගැනීමේ සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ/ඇයගේ කාර්ය සාධනය සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීමෙන් පසුව, පරිවාස කාලය අවසානයේදී ඔහු/ඇය තනතුරේ ස්ථිර කෙරෙනු ලැබේ. දැනටමත් තනතුරේ ස්ථිර කර ඇති අභ්‍යන්තර සේවකයන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත් වෙනු ඇත.

**බඳවාගැනීමේ පටිපාටිය :**

ලිඛිත විභාගයක් සහ/හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය තුළින්

## කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර :**

**අධ්‍යාපන**

1. අ.පො.ස. (සා/පෙ) විභාගයෙන්
   i. සිංහල/දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය, ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් සමත් වී තිබීම

සහ

2. විද්‍යාව, ගණිතය, තාක්ෂණය හෝ වාණිජ විෂය ධාරාව යටතේ අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් එක් වරකදී විෂයයන් තුනකින් සමත් වීම (පොදු ප්‍රශ්න පත්‍රය හැර)

සහ

3. පිළිගත් ආයතනයකින් මාස 06 ක පරිගණක යෙදුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

පහත සුදුසුකම්වලින් සමන්විත ප්‍රාථමික - පුහුණු, ප්‍රාථමික - අර්ධ පුහුණු සහ ප්‍රාථමික - නුපුහුණු කාණ්ඩවල සේවකයන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**අධ්‍යාපන :**

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන්
   i. සිංහල/දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් සමත් වී තිබීම.

**වෙනත් :**

ඉහත සේවා කාණ්ඩය යටතේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

පිළිගත් ආයතනයකින් මාස 06 ක පරිගණක යෙදුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය :** MA 1-2 - 2025 - රු 46,220 - 10x540 - 7x630 - 12x1080 - 12x1280 = 84,350

කෙසේ වෙතත්, 2027.01.01 දින දක්වා සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා වන වේතන MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුකූල විය යුතුය.

**වයස :**

වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ස්ථිර කිරීම :**

මෙම කාණ්ඩයේ III ශ්‍රේණියට පත්වීම් ලබන බාහිර අපේක්ෂකයකු, රාජකාරි භාරගැනීමේ සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ/ඇයගේ කාර්ය සාධනය සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය සමත් වීමෙන් පසුව, පරිවාස කාලය අවසානයේදී ඔහු/ඇය තනතුරේ ස්ථිර කෙරෙනු ලැබේ. දැනටමත් තනතුරේ ස්ථිර කර ඇති අභ්‍යන්තර සේවකයන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත් වෙනු ඇත.

**බඳවාගැනීමේ පටිපාටිය**

ලිඛිත විභාගයක් සහ/හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය තුළින්

**සභාපති,**
**ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය.**

SELACINE MEDIA SOLUTIONS